සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත Provincial Department of Education, Eastern Province පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත Provincial Department of Education, Eastern Province පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත Provincial Department of Education, Eastern Province පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026 (ජුනි-ජූලි)
General Certificate of Education (Adv.Level) Practice Test – 2026 (June-July)

බෞද්ධ ශිෂ්ටාචාරය I
Buddhst Civilization I

45 S I

ශ්‍රේණිය - 13
Grade - 13

පැය දෙකයි
Three hours

උපදෙස්:
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ලකුණු කරන්න.

01. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය , ශූද්‍ර යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

1) වර්ණ ධර්ම නමිනි. 2) ආශ්‍රම ධර්ම නමිනි. 3) ස්ව ධර්ම නමිනි.
4) ආපද් ධර්ම නමිනි. 5) නියාම ධර්ම නමිනි.

02. බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් පුද්ගලයාගේ ජීවිතය අවධි හතරකට බෙදා දක්වනු ලබයි. එහි ලා බ්‍රහ්මචාරී අවධියේ දී සපිරිය යුතු මූලික කාර්යය ලෙස අවධාරණය කොට ඇත්තේ ,

1) ගෘහ ජීවිතය අතහැර බ්‍රහ්මචාරීව විසීමයි.
2) බ්‍රහ්මචාරීව නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමයි.
3) දිවි ඇතිතෙක් බ්‍රහ්මචාරීව විසීමයි.
4) බ්‍රහ්මචාරී දිවි පෙවතින් මිදී විවාහ ජීවිතයක් ගත කිරීමයි.
5) සන්‍යාසියකු ලෙස බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමයි.

03. ප්‍රාග් වෛදික යුගයේ පැවති මූලික ආගමික පිළිවෙතක් වූයේ,

1) ඊශ්වර වන්දනයයි. 2) සති පූජාවයි.
3) ජගදාත්මය සමග එක්වීමට පිළිවෙත් පිරීමයි. 4) ජගන්මාතා වන්දනයයි.
5) බ්‍රහ්ම සහව්‍යතාවට පත් වීමට පූජා පැවැත්වීමයි.

04. සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහය ඉදිරිපත් කරන දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය, සමකාලීනව භාරතයේ පැවති සියලු ආගමික සම්ප්‍රදායවල ඉගැන්වීම් වලට වෙනස් වූ ආකල්පයක් ගනී. එම විග්‍රහය අනුව සමාජ පරිණාමය සිදු වී ඇත්තේ,

1) කර්මානුරූපීව යි. 2) හේතු ප්‍රත්‍ය රහිතවයි. 3) දේවනිර්මාණයක් ලෙසයි.
4) හේතුඵලවාදීවයි. 5) නියති පරිනාමයක් ලෙසයි.

Past Papers Wiki

05. පොළොවේ වසන සියලුම සතුන් ඝාතනය කොට එකම මස් ගොඩක් කළේ වී නමුත් ඉන් කිසිදු පාපයක් සිදු නොවන බව ප්‍රකාශ කළේ,

1) නිගණ්ඨනාතපුත්ත ය. 2) පූර්ණ කස්සප ය. 3) අජිත කේසකම්බලී ය.
4) මක්ඛලී ගෝසාල 5) සංජය බෙල්ලට්ඨීපුත්ත ය.

06. '' ජන සම්මතවාදී පාලනයක සාම්ප්‍රදායික මූලධර්ම රැකගනිමින් පාලන කටයුතු සිදු කිරීමෙන් එකී පාලන තන්ත්‍රය පහසුවෙන් බිඳ නොවැටෙන්නේ ය.'' යනු බුදු සමයේ පිළිගැනීමයි. එවැනි සාරධර්ම පද්ධතියක් ලෙස හැඳින්විය හැක්කේ,

1 සතර සංග්‍රහ වස්තුවයි. 2. පංචශීල ප්‍රතිපදාවයි. 3. සප්ත අපරිහානීය ධර්මයයි.
4. දස රාජ ධර්මයයි. 5. දස සක්විතිවත් ය.

07. සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය ප්‍රකට කෙරෙන විවිධ අවස්ථා බෞද්ධ මූලාශ්‍රවලින් හඳුනාගත හැකි ය. දීඝ නිකායේ සක්කපඤ්හ සූත්‍රයේ , බුදුරදුන් පංචශිඛ නම් ගාන්ධර්වයාගේ ගායනයත් , වාදනයත් ඇගයීමට ලක් කළ ආකාරය සඳහන් වේ. රහතන් වහන්සේලාත්, රහත් තෙරණින් වහන්සේලාත් සොබා සුන්දරත්වය අත් විඳි අයුරු ථේර - ථේරී ගාථාවල විස්තර වෙයි. මෙසේ බෞද්ධ මූලාශ්‍රවලින් ප්‍රකට වන සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය වන්නේ,

1. සුන්දරත්වය මත පදනම් ව ලබන ආස්වාදයයි.
2. සොබා දහමේ අසිරිය දැකීමෙන් ලබන ආස්වාදයයි.
3. උපාදාන ග්‍රහණයෙන් තොර ව ලබන ආස්වාදයයි.
4. පංචේන්ද්‍රිය පිණවීමෙන් ලබන ආස්වාදයයි.
5. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දැකීමෙන් ලබන ආස්වාදයයි.

08. බුද්ධකාලීන භාරතයේ ව්‍යාප්තව තිබූ බ්‍රාහ්මණ සංස්කෘතියට අමතරව විවිධ ආගමික ව්‍රත, චර්යා අනුගමනය කළ පැවිද්දෝ වූහ. මොවුන් ආජීවක, පරිබ්‍රාජක , අචේලක , නිගණ්ඨ, ඒකසාටක , ජටිල ආදී නම් වලින් හැඳින් වූ බව පෙනේ. ඇතැම් ශ්‍රමණයෝ දුෂ්කර ව්‍රත අනුගමන කළ අත්තකිලමාතානුයෝගීහු වූහ. මේ අතර බුදුරජාණන් වහනසේ ගොඩනැගූ පැවිදි සංවිධාන '' ශාක්‍යපුත්‍ර ශ්‍රමණ'' නම් විය. මේ අනුව කාලීන භාරතයේ පැවති මුඛ්‍යතම ආගමික සම්ප්‍රදාය දෙක හඳුන්වනු ලබන්නේ,

1. බෞද්ධ හා නිගණ්ඨ යනුවෙනි. 2. බෞද්ධ හා පරිබ්‍රාජක යනුවෙනි.
3. නිගණ්ඨ හා ආජීවක යනුවෙනි. 4. ශ්‍රමණ හා බ්‍රාහ්මණ යනුවෙනි.
5. ආජීවක හා ජටිල යනුවෙනි.

09. ජන්මීය සාධක පදනම් කොට ගෙන බ්‍රාහ්මණ සම්ප්‍රදාය විසින් මානව වර්ගයා උසස් පහත් වශයෙන් බෙදා වෙන් කොට දක්වනු ලැබීය. බුදු සමය මෙකී වර්ගීකරණය බැහැර කරමින් චතුර් වර්ණයම සමාන යැයි ද, මානව සංහතියේ ඇත්තේ නානාත්වයක් නොව ඒකත්වයක් බව ද පෙන්වා දෙයි. එසේ නමුත් මානවවර්ගයාගේ යම් විවිධත්වයක් දැකිය හැකි යයි ද අවධාරණය කෙරේ. එකී විවිධත්වයට හේතු වන්නේ,

1) ජීව විද්‍යාත්මක පදනමයි. 2) ඓතිහාසික පදනමයි.
3) සමාජ විද්‍යාත්මක පදනමයි. 4) ආචාර විද්‍යාත්මක පදනමයි.
5) ආර්ථික විද්‍යාත්මක පදනමයි.

10. වෛදික සමාජය තුළ කාන්තාව සමාජයීය වශයෙන් මෙන් ම ආගමික වශයෙන් ද පුරුෂයා හා සමාන වරප්‍රසාද අහිමි, ආගමික වශයෙන් ද පුරුෂයා හා සමාන වරප්‍රසාද අහිමි,තැනැත්තියක් වූවාය. ඇය චපල, අපිරිසිදු, බුද්ධියෙන් හීන ආධ්‍යාත්මික විමුක්තිය සාධනයෙහි ලා අසම්මත් තැනැත්තියක ලෙස ද සලකන ලදී. එසේ නමුත් බුදුසමය තුළ කාන්තාව පූර්ණ නිදහසක් භුක්ති වින්දාය. භික්ෂුණියක , උපාසිකාවත, මවක හා බිරිඳක ලෙස ඈ ලද නිදහස පෙළ දහමින් තහවුරු වේ. උපාසිකාවක ලෙස බුද්ධ කාලීනව ප්‍රකට එවැනි පරමාදර්ශී කාන්තාවක් වූයේ,

1) උප්පලවණ්ණා ය. 2) ධම්මදින්නා ය 3) ඛේමා ය.
4) ඛුජ්ජුත්තරා ය. 5) පටාචාරා ය.

11. ප්‍රාදේශීය පාලකවරු ස්වාධීනත්වය පළ කරමින් වෙන් ව යාම, සොළොස් මහා ජනපද බිහිවීම, භාරතීය දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙයි. ක්‍රි.පූ අටවැනි සියවසේ දී පමණ සිදු වූ මෙවැනි දේශපාලනික පරිවර්තනයකට ඉවහල් වූ ප්‍රධාන ඓතිහාසික සාධකය ලෙස සැලකෙන්නේ,

1) පෞරව අධිරාජ්‍යයේ පරිහානියයි.

2) රාජ්‍යයන් අතර එකමුතුවක් නොමැති වීමයි.

3) අධිරාජ්‍යයක් ගොඩ නැගීමට පාලකයන් අතර පැවති අරගලයයි.

4) බ්‍රාහ්මණ කුලය අභිබවා ක්ෂත්‍රීය කුලය නැගී සිටීමයි.

5) භාරතයට ජාත්‍යන්තර බලපෑම වැඩි වීමයි.

12. පුද්ගලයා විසින් උපයන ලද ධනය කොටස් හතරකට බෙදා කළමණාකරණය කොට පරිභෝග කළ යුතු බව සිඟාලෝවාද සූත්‍රයෙහි දක්වා තිබේ. ඒ අනුව පළමු කොටස පරිභෝජනයටත් , දෙකොටසක් ආයෝජනයටත් , සිව් වන කොටස තැන්පත් කොට ආපදා අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීමටත් යෙදවිය යුතුය. දෙමාපිය පෝෂණය, සමාජ යුතුකම් ඉටු කිරීම හා මතු සුව පිණිස හේතුවන , මහණ බමුණන් විෂයෙහි දන්දීමට වැය කළ යුත්තේ සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි,

1) 'එකෙන භෝගෙ භුංජෙය්‍ය' යන කොටසෙනි.

2) 'ද්වීහි කම්මං පයොජයේ' යන කොටසෙනි.

3) 'චතුත්ථං ච නිධාපෙය්‍ය' යන කොටසෙනි.

4) ඉහත කොටස් හතරින් ටික ටික වෙන් කර ගැනීමෙනි.

5) පළමු කොටස හැර අනෙක් කොටස් වලිනි.

13. බුද්ධකාලීන භාරතයේ පැවති පාලන තන්ත්‍ර පිළිබඳ ව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) වෛශාලිය අගනගරය කරගත් වජ්ජි රාජ්‍යය ප්‍රබල රාජාණ්ඩුවකි, යන්නයි.

2) රජගහනුවර අගනගරය කරගත් මගධ රාජ්‍යය ගණතන්ත්‍ර පාලනයකි, යන්නයි.

3) සාවත්ථීය අගනගරය කරගත් කොසොල් රාජ්‍යය කුඩා රාජාණ්ඩුවකි, යන්නයි.

4) කුසිනාරාව අගනගරය කරගත් මල්ල රාජ්‍යය ගණතන්ත්‍ර පාලනයකි, යන්නයි.

5) උදේනිය අගනගරය කරගත් අවන්ති රාජ්‍යය සමූහාණ්ඩුවකි, යන්නයි.

14. බුදුසමයට අනුව රාජ්‍යය පියපුතු උරුමයෙන් හෝ දේව වරමින් ලද්දක් නොවේ. දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය මහජන සම්මුතියෙන් පාලකයා පත් වූ බවත්, ඔහු 'රාජා' යන අපර නාමයකින් හැඳින්වූ බවත් සඳහන් කරයි. මෙහිලා 'රාජා' යන්න භාවිතයට පැමිණියේ පාලකයා,

1. ගැරහිය යුත්තන්ට ගරහා පාලනය කරන්නකු වූ බැවිනි.
2. හෙලා දැකිය යුත්තන් හෙලා දැක පාලනය කරන්නකු වූ බැවිනි.
3. නෙරපිය යුත්තන් නෙරපා පාලනය කරන්නකු වූ බැවිනි.
4. කෙත්වතු ආරක්ෂා කොට පාලනය කරන්නකු වූ බැවිනි.
5. ජනතාව සතුටු කොට පාලනය කරන්නකු වූ බැවිනි.

15. බුදුරජාණන් වහන්සේ තුළ පැවති අසාමාන්‍ය ප්‍රඥාව, මහා ප්‍රඥාව නමින් හැඳින්වෙන අතර එය,

1. අගතිගාමී නොවී සමානාත්මතාවෙන් යුක්ත ව කටයුතු කිරීමෙන් පැහැදිලි වේ.
2. අනුගාමිකයන්ගේ දක්ෂතා හා ප්‍රවීණතා අගය කිරීම තුළින් පැහැදිලි වේ.
3. ගැටලු විසඳීම හා ප්‍රශ්නවලට පිළිතුරු දීම ආදියෙන් පැහැදිලි වේ.
4. අධර්ම චර්යා හේතුවෙන් සසර දුකට පත්වූවන් ඉන් මුදවා ගැනීමට උත්සුක වීමෙන් පැහැදිලි වේ.
5. ''මෙම ධර්මය ප්‍රඥාවන්තයින් සඳහා මිස ප්‍රඥාව නැති අය සඳහා නොවේ'' යයි දේශනා කිරීමෙන් පැහැදිලි වේ.

16. රටක පාලකයා ජනතාවගේ සිතුම් පැතුම් හා හැකියා හඳුනාගෙන කෘෂිකර්මාන්තයට උනන්දු වන අයට බිජ හා පොහොර ද වෙළඳාමට උනන්දු වන අයට ප්‍රාග්ධනය ද රාජ්‍ය සේවය රුචි වූවන්ට බත් වැටුප් ආදිය ද ලබා දීමට අනුබල දෙන බෞද්ධ දේශපාලන මූලධර්මය අන්තර්ගත වන්නේ,

1. ජාතක පාළියේ ය.
2. චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
3. මහා පරිනිබ්බාන සූත්‍රයේ ය.
4. අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
5. කූටදන්ත සූත්‍රයේ ය.

17. බෞද්ධ විග්‍රහයට අනුව සචේතනිකවූත්, ආචාරාත්මකවූත් හොඳ නරක පුද්ගල ක්‍රියා කිසියම් නිර්ණායකයක් පදනම් කොට ගෙන විනිශ්චය කරනු ලබයි. මෙහිලා එවැනි නිර්ණායකයක් ලෙස නොසැලකිය හැකි ධර්මපරියාය වන්නේ,

1. 'සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යය' යන්නයි.
2. 'විපාකය අමිහිරි නම් නොකළ යුතු ය' යන්නයි.
3. 'තමා අධිපති කොට කල්පනා කළ යුතු ය' යන්නයි.
4. 'තමන් , අනුන් හා උභය පක්ෂයට සිදුවන යහපත අයහපත සලකා බැලිය යුතු ය' යන්නයි.
5. 'තම හෘද සාක්ෂියට අනුව තීරණය කළ යුතු ය' යන්නයි.

18. දස සක්විතිවත් පිළිබඳ බෞද්ධ ඉගැන්වීමට අනුව සක්විති රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙතට ඇතුළත් නොවන්නේ,

1) 'අන්තඃපුර ජනයා කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය.' යන්නයි.
2) 'බල සේනාව කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය.' යන්නයි.
3) 'බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය.' යන්නයි.
4) 'විවාහක අවිවාහක ස්ත්‍රීන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය.' යන්නයි.
5) 'ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි රක්ෂාවරණය සංවිධානය කළ යුතුය.' යන්නයි.

19. 'ආධිපතෙය්‍යධම්ම' යනුවෙන් හැඳින්වෙන්නේ අධිපති ධර්මයයි. බුදුසමයෙහි අධිපති ධර්මවල උපයෝගීතාව අවධාරණය කොට ඇත්තේ,

1) පින් පව්වල ප්‍රබලත්වය හා දුබල බව හඳුනාගැනීම පිණිසය.
2) ආරාම පාලනයෙහිලා ප්‍රධානත්වය හඳුනාගැනීම පිණිසය.
3) ධර්මයේ හරි වැරදි විනිශ්චය කරගැනීම පිණිසය.
4) කුසල් අකුසල් විනිශ්චය කරගැනීම පිණිසය.
5) විනය නීතිවල උචිත අනුචිත බව තහවුරු කරගැනීම පිණිසය.

20. එකම දිනක දී සිය සැමියාත්, පුතුන් දෙදෙනාත් , මව සහ පියාත්, සහෝදරයාත් මරණයට පත්වීමෙන් අසරණ වූ පටාචාරාවට බුදුරජාණන් වහනසේගේ මහා කරුණා ගුණය නිසා නිවී සැනසී ශාසනික තනතුරු පවා ලැබූ බව මූලග්‍රයෙහි දැක්වේ. ඒ අනුව පටාචාරාව අගතනතුරට පත්වූයේ,

1) ධර්මධර භික්ෂුණීන් අතරය.
2) ධූතාංගධර භික්ෂුණීන් අතරය.
3) විනයධර භික්ෂුණීන් අතරය.
4) ධර්මකථික භික්ෂුණීන් අතරය.
5) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතරය.

21. බුදුරජාණන් වහන්සේ ශාස්වත- අශාස්වත යන අන්තද්වයට නො පැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද, සුදුසු වචන යහපත්ව කියන බැවින් ද සුවිශේෂ නාමයකින් හඳුන්වන බව නව අරහාදී බුදු ගුණ විවරණයෙන් පැහැදිලි වේ. එම බුදුගුණය හැඳින්වෙන්නේ,

1) ලෝකවිදූ නමිනි.
2) අරහං නමිනි.
3) සුගත නමිනි.
4) සම්මාසම්බුද්ධ නමිනි.
5) භගවා නමිනි.

22. පරිසර සංරක්ෂණයෙහි ලා බුදුසමයේ අවධානය කෙතෙක් ද යන්න සූත්‍ර පිටකයේ මෙන්ම විනය පිටකයේ ද එන විවිධ තොරතුරුවලින් පැහැදිලිය. ඒම මූලාශ්‍ර තුළ රුක් රෝපණය, උද්‍යාන නිර්මාණය, ඒ දඬු පාලම් සෑදීම, පැන්හල්, පැන් පොකුණු නිර්මාණය, දිවා රෑ පිං වැඩෙන පිංකම් ලෙස දක්වා තිබේ. එම දේශනාව ඇතුළත් වන්නේ,

1) සිංසපා සූත්‍රයේ ය.
2) මහාපරිනිබ්බාණ සූත්‍රයේ ය.
3) වනරෝප සූත්‍රයේ ය.
4) මෙත්ත සූත්‍රයේ ය.
5) අරියපරියෙසන සූත්‍රයේ ය.

23. "භවත්නි, නිහඬ වන්න. ශබ්ද කරන්න එපා. මේ ශ්‍රමණයන් නිහඬ බව කැමතිය. නිහඬ බවේ ගුණ කියති." යනුවෙන් ප්‍රකාශ කරමින් තම ශ්‍රාවක පිරිස නිහඬ කළේ,

1. සකුළුදායී පිරිවැජියා
2. පොට්ඨපාද පිරිවැජියා
3. නිග්‍රෝධ පිරිවැජියා
4. සෝණදණ්ඩ බමුණා
5. වච්ඡගොත්ත පිරිවැජියා

24. සත්වයා සහ ලෝකය පිළිබඳ විවිධ දර්ශනවාද පළකළ භාරතීය චින්තකයන් අතරින් ශ්‍රමණයෝ ප්‍රමුඛ වෙති. ඔවුන් හඳුන්වාදෙන ලද දර්ශනවාදයක් ලෙස නොසැලකිය හැක්කේ,

1. උච්ඡේදවාදයයි. 2. භෞතිකවාදයයි. 3. ශාස්වත වාදයයි.
4. අනීශ්වරවාද නොපිළිගැනීමයි. 5. නියතිවාදයයි.

25. මදුරට සාගල නුවර මද්දව රජතුමාගේ දියණියක වූ ඕ තොමෝ දෘශ්‍යාධාර භාවිතා කොට රූපයේ යථාවබෝධය ලබා සෝවාන් ඵලයට පත්වූවාය. පසුකලෙක ශාසනයේ පැවිදිව සිව්පිළිසිඹියාපත් සහිතව රහත්භාවයට පත් වූ භික්ෂුණිය ලෙසද හැඳින්වෙන එම භික්ෂුණිය,

1. ඛේමා භික්ෂුණියයි. 2. උත්පලවණ්ණා භික්ෂුණියයි. 3. මහා ප්‍රජාපති භික්ෂුණියයි.
4. පටාචාරා භික්ෂුණියයි. 5. නන්දා භික්ෂුණියි.

26. සිඟාලොවාද සූත්‍රයේ සඳහන් ආචාර ධර්මයන්ට අනුව දානෙයන් ප්‍රිය වචනෙයන් අර්ථ චරියාවෙන් සමානාත්මතාවයෙන් නොරැවටීමෙන් සැලකිළි දැක්විය යුත්තේ

1. මහණ බමුණන්ට ය. 2. ගුරුවරුන්ට ය. 3. දෙමාපියන්ට ය
4. මිතුරන්ට ය. 5. දැසිදස් කම්කරුවන්ට ය.

27. "මහණෙනි, බොහෝ ජනයාගේ හිතසුව පිණිස ධර්ම චාරිකාවේ හැසිරෙන්න". යනුවෙන් සිය ශ්‍රාවකයින්ට උපදෙස් ලබා දී බුදුන් වහන්සේ ද උරුවෙල් දනව්ව බලා වැඩි සේක.උන්වහන්සේ එසේ වැඩම කළේ,

1. උරුවෙල් කාස්සපගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි,
2. ධ්‍යාන සමාපත්තියට සම වැදීමේ අරමුණිනි.
3. උරුවෙල් වැසියන්ගේ ආරාධනයකට ප්‍රතිචාර ලෙසයි.
4. විවේක සුවයෙන් වැඩ සිටීමේ අරමුණෙනි.
5. යථාවාදී තථාකාරී ගුණයෙන් යුතුව කටයුතු කළ බැවිනි,

28. ප්‍රථම ධර්ම සංගායනාවේ දී ධර්ම විනය සංරක්ෂණය සඳහා සමස්ථ බුද්ධ වචනය ග්‍රන්ථ වශයෙන් වර්ගීකරණය කරන ලදි. එහිදී ධර්මය සංග්‍රහ කරන ලද්දේ

1. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, බුද්දඛක නිකාය වශයෙනි.
2. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, පාරාජිකි පාලි, පාචිත්තිය පාලි වශයෙනි.
3. පාරාජිකි පාලි , පාචිත්තිය පාලි, චුල්ලවග්ග පාලි, මහාවග්ග පාලි, පරිවාර පාලි වශයෙනි.
4. ධම්ම සංගනී, විභංග, ධාතු කථා, පුද්ගල ප්‍රඤ්ඤප්ති, යමක වශයෙනි,
5. දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, සියම් නිකාය, අමරපුර නිකාය වශයෙනි,

29. තෙවන ධර්ම සංගායනාවේ දී ගනු ලැබූ තීරණයකට අනුව භාරතය තුළ හා භාරතයෙන් පිටත රටවල් නවයකට ධර්ම දූතයන් වහන්සේලා පිටත් කර යවන ලදි. මෙම වැඩපිළිවෙල අනුව මහාදේව හිමිට වැඩම කිරීමට ලැබුණේ,

1. යෝනක දේශයට ය 2. අපරන්ත දේශයට ය 3. මහිස මණ්ඩලයට ය.
4. හිමවත් දේශයට ය. 5. වනවාස දේශයට ය.

30. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් නොවන්නේ,

1. ස්ථවිරවාද හා මහාසාංඝික වශයෙන් භික්ෂූන් කොටස් දෙකකට බෙදීම
2. ධර්මය විනය සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා භික්ෂු කණ්ඩායම් වලට පැවැරීම
3. මහායානයේ ආරම්භයට මූල බීජ මතු වීමයි.
4. ස්ථවිරවාදීන් නිකාය 12 ක් දක්වා බෙදී යාමට මුල පිරීමයි.
5. අලජ්ජිපාපී භික්ෂූන් ලෙස නම් කොට දස දහසක් භික්ෂූන් ථේරවාදී සම්ප්‍රදායෙන් ඉවත කිරීමයි.

31. බුද්ධ කාලීන භාරතයේ ධර්ම ප්‍රචාරයෙහි දී " ධර්මය සිතින් විතර්කනය කිරීමත් විවරණය කිරීමත් මනසින් ප්‍රත්‍යවේක්ෂණය කර බැලීමත් ධර්මයේ විර පැවැත්මට උපයෝගී වන බව" දැක්වෙන සූත්‍රය වන්නේ,

1. සිඟාලෝවාද සූත්‍රයේදී ය.
2. සංගීති සූත්‍රයේදී ය.

3. මහාමංගල සූත්‍රයේදී ය.
4. ධම්මපදයේ දීය
5. පාසාදික සූත්‍රයේදී ය.

32. ධර්මාශෝක රාජ්‍ය සමයේ භික්ෂූන් වහන්සේලා වසර ගණනාවක් පොහොය කර්ම කිරීමෙන් වැළකී සිටි බව මූලාශ්‍රවල සඳහන වේ. එයට හේතුව ලෙස දක්වන්නේ

1. දුස්සිල භික්ෂූන් සුලභ වීමම
2. රාජ්‍ය අනුග්‍රහය නොලැබීම
3. අනන්‍යාගමික තර්ජන බහුල වීම
4. උපසපන් භික්ෂූන් නොසිටීම
5. පොහොය සීමා නොමැති වීම

33. ධර්මාශෝක අධිරාජ්‍යයා බෞද්ධයෙකු වුව ද අනෙකුත් ආගමිකයිනට අවශ්‍ය පහසුකම් සපයා දුන් බවත් ආජීවකයන් ට ආරාම පූජා කළ බවත් සඳහන් වන්නේ,

1. හත්වන ගිරි ලිපියේ
2. කාල්සි ගිරි ලිපියේ
3. ගිරිනාර් ගිරි ලිපියේ
4. කන්දහාර් ගිරි ලිපියේ
5. බරාබර් ගිරි ලිපියේ

34. කණිෂ්ක රජතුමා විසින් බුදු සමයේ විරස්තිථිය පිණිස සිදු කරන ලද තුනක් පහත ප්‍රකාශවල අන්තර්ගතය.

A සිව්වන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වීම
B දුසිල් භික්ෂූන් සසුනෙන් නෙරපා ඝාසන සංශෝධනයක් සිදු කිරීමට පියවර ගැනීම
C ධර්මය තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක බහා එය නිදන් කොට මහා සෑයක් ඉදි කිරීම
D කාසිවලට බුදු රුව ඇතුලත් කිරීම
E ධර්ම මහාඅමාත්‍යවරුන් පත් කොට භාරතය තුළ හා භාරතයෙන් පිටත ධර්ම ප්‍රචාරයට කටයුත් කිරීම.
මින් නිවැරදි ප්‍රකාශ ඇතුලත් වර්ණය වන්නේ,

1. A, C හා D
2. A, B හා C
3. B, C හා D
4. B, D හා E
5. C, D හා E

35. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ පැවැති සිව්වන ධර්ම සංගායනාවට රාජ්‍ය අනුග්‍රහය දක්වන ලද්දේ

1. ශක්‍රාදිත්‍ය රජු විසිනි.
2. අශෝක රජු විසිනි.
3. කණිෂ්ක රජු යිසිනි.
4. කවිෂ්ක රජු විසිනි.
5. මිළිඳු රජු විසිනි.

36. පැරණි භාරතීය විශ්ව විද්‍යාලයක කීර්තිමත් ආචාර්යවරයෙකු වූ යෙකු වූ ශාන්තරක්ෂිත හිමියන් ප්‍රමුඛ මහායාන පඬිවරයෙකි. උන්වහන්සේ ආචාර්යවරයෙකු ලෙස සේවය කළේ,

1. ඕදන්තපුර විශ්ව විද්‍යාලයේදී ය
2. ඕදන්තපුර විශ්ව විද්‍යාලයේදී ය
3. වලභී විශ්ව විද්‍යාලයේදී ය
4. නාලන්දා විශ්ව විද්‍යාලයේදී ය
5. ජගද්දලා විශ්ව විද්‍යාලයේදී ය

37. වික්‍රමශීලා විශ්ව විද්‍යාලයේ ද්වාර පණ්ඩිතවරුන්ගේ ප්‍රධාන කාර්යය වන්නේ,

1. විෂය නිර්දේශ සැකසීම
2. ප්‍රවේශ පරීක්ෂණයකින් සිසුන් තෝරා ගැනීම
3. පරිපාලන කටයුතු මෙහෙය වීම
4. විනය කටයුතු පවත්වාගෙන යාම

5. ප්‍රවේශ දොරටුවල ආරක්ෂාව සැපයීම

38. මහසෙන් රජතුමා ලාංකික බුදු සමයේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කළ බවට සාධකයක් ලෙස හඳුනාගත හැක්කේ

1. ජේතවන විහාරය ඉදි කොට භික්ෂූන් ට පූජා කිරීමයි.
2. විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්තිථිය ඇති කිරීමයි.
3. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඩ කිරීමට අනුග්‍රහන දැක්වීමයි.
4. රටපුරා දන්සැල් විවෘත කොට භික්ෂු සංඝයාට දන් දීම
5. ශාසන විරෝධි භික්ෂූන් හැට දෙනෙකු රටින් පිටුවහල් කිරීම

39. වලගම්බා රජු විසින් ඉදි කොට පූජා කළ අභයගිරි විහාරය පිළිගත් තිස්ස තෙරුන් මහා විහාරයෙන් නෙරපා දැමීමට තීරණය කරන ලද්දේ එම තෙරණුවන්

1. මහාවිහාරයට එරෙහිව ගොඩ නැගුණු නව ආරාමයක් පිළිගැනීම නිසා ය.
2. වළගම්බා රජුට පක්ෂපාතීව ක්‍රියා කළ නිසා ය.
3. දේශපාලනයට සම්බන්ධ වී සිටි නිසා ය.
4. මහාවිහාරික භික්ෂූන්ගේ අවවාද නොපිළිගත් නිසා ය.
5. විනය විරෝධිව කටයුතු කළ නිසා ය.

40. පණ්ඩුකාභය රජු චිත්තරාජ යක්ෂයාට අභය වැවේ පහළ ප්‍රදේශයේ වාසස්ථානයක් කරවා දීමට ප්‍රධාන හේතුව වූයේ

1. කුඩා කළ රජුගේ ජීවිතය ආරක්ෂා කළ නිසා ය.
2. රජුට දාසයෙකු ලෙස සේවය කළ නිසා ය.
3. රජුගේ මවගේ ආරක්ෂකයෙකු වීම නිසා ය.
4. රජුගේ පියාගේ ආරක්ෂකයෙකු වීම නිසා ය.
5. රජුට යුද්ධය ජය ගැනීමට සහය වූ නිසා ය.

41. මිය ගිය ඥාතීන්ට සංග්‍රහ කිරීම සඳහා ජපන් බෞද්ධයන් විසින් මහත් හරසරින් පවත්වනු ලබන බෞද්ධ උත්සවය හැඳින්වෙන්නේ ,

1. ජෝ දෝ නමිනි.
2. හනමත්සුරි නමිනි.
3. බොන් නමිනි
4. කබුකි නමිනි
5. නෙහන් ඒ නමිනි.

42. ශ්‍රී ලාංකික කලා කරුවා විවිධ මුද්‍රාවලින් යුත් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට ඇත. ඒ අතරින් අවුකන බුද්ධ ප්‍රතිමාවෙන් නිරූපනය වන්නේ,

1. වරද මුද්‍රාවයි.
2. විතර්ක මුද්‍රාවයි.
3. භූමි ස්පර්ෂ මුද්‍රාවයි.
4. අභය මුද්‍රාවයි
5. ධර්ම චක්‍ර මුද්‍රාවයි.

43. සඳකඩ පහණේ ඒක් පෙළට ගමන් කරන සතුන් හතර දෙනාගෙන් සතර දිසාව සංකේතවත් වන බව ප්‍රකාශ කරන ලද්දේ,

1. විනි විතාරණ විසිනි.
2. H.C.P. බෙල් විසිනි.
3. වින්සන් ස්මිත් විසිනි.
4. D.T.දේවේන්ද්‍ර විසිනි
5. විලියම් වෝඩ් විසිනි.

44. දඹදෙණි යුගයේ දී ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කෘති රැසක් බිහි වී තිබේ. ඒ අතර තත්කාලීනව වඩාත් සම්භාවනාවට පත්ව තිබූ පද්‍ය කෘතිය වන්නේ,

1. කව්සිළුමිණයි
2. සද්ධර්මරත්නාවලියයි
3. ථූපවංශයයි.
4. බුත්සරණයි
5. පූජාවලියයි.

45. ස්ථූප කලාවේදී ලාංකීය කලා කරුවා ජන හදවත් තුළ ශ්‍රද්ධාව ජනනය වන අයුරින් ඉතා කලාත්මකව මෙන් ම අර්ථාන්විතව ස්ථූප නිර්මාණය කර තිබේ. එම ස්ථූප ආකෘති භයකින් නිර්මාණය කර තිබීම ලාංකීය ස්තූප කලාවේ සුවිශේෂත්වයකි. ඒ අනුව කතරගම කිරිවෙහෙර ස්ථූපය නිර්මාණය කර ඇති ආකෘතිය වන්නේ,

1. බුබ්බුලාකාර ආකෘතියටයි.
2. ධාන්‍යාකාර ආකෘතියටයි.
3. ගණ්ඨාකාර ආකෘතියටයි.
4. ආමලාකාර ආකෘතියටයි.
5. පද්මාකාර ආකෘතියටයි.

46. ලාංකීය කලා නිර්මාණ අතර ගොඩනැගිල්ලකට පිවිසීමට ඇති පියගැටපෙළ දෙපසින් පියගැටපෙලේ ආරක්ෂාවටත් ගමන් කරන්නන්ගේ පහසුවටත් නිර්මාණය කර ඇති කලා නිර්මාණය වන්නේ,

1. මුරගල යි.
2. සඳකඩ පහණයි.
3. කොරවක්ගලයි
4. මේ කිසිවක් නොවේ.
5. ඉහත සියල්ලම

47. පහත කෘති අතරින් අටුවා ග්‍රන්තයක් නොවන්නේ කුමක් ද?

1. සුමංගල විලාසිනිය
2. පපඤ්චසූදනිය
3. මනොරථපූරණිය
4. පූජාවලිය
5. පරමත්ථදීපනී ය

48. බෞද්ධාගමික කාර්යයන් වඩාත් පහසුවෙන් සිදු කර ගැනීම අරමුණු කර ගනිමින් "භික්ෂු කොමසාරිස්වරු" පත්කර ඇති රට වන්නේ,

1. බුරුමය යි
2. තායිලන්තය යි
3. චීනය යි
4. ජපානය යි
5. ශ්‍රී ලංකාව යි

49. "මරමිම දේශය" නමින් හඳුන්වා ඇති රට ලෙස සැලකෙන්නේ,

1. ජපානය යි
2. කොරියාව යි
3. බුරුමය යි.
4. තායිලන්තය යි
5. චීනය යි

50. ලෝකයේ බොහෝ රටවල පවතින සුවිශේෂිතාවයක් හේතුවෙන් එම රටවල් අන්වර්ථ නාමයන්ගෙන් හඳුන්වනු ඇත. ඉන් චීනය හඳුන්වා ඇත්තේ,

1. නිදහස් දේශය නමිනි.
2. කුල භේදය නොසලකන රට ලෙසිනි
3. පැගෝඩා දේශය නමිනි.
4. ආගම් තුනේ රට නමිනි.
5. සියම් දේශය නමිනි.

PAST PAPERS WIKI

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි] All Rights Reserved]

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත
Provincial Department of Education, Eastern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026 (ජුනි-ජූලි)
General Certificate of Education (Adv.Level) Practice Test – 2026 (June-July)

බෞද්ධ ශිෂ්ටාචාරය II
Buddhst Civilization II

45 S II

ශ්‍රේණිය - 13
Grade - 13

පැය තුනයි
Three hours

අමතර කියවීමේ කාලය; - මිනිත්තු 10;
Additional Reading Time - 10 minutes

අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්:
I කොටසේ ප්‍රශ්න දෙකකට සහ II කොටසේ ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න. මුළු ප්‍රශ්න පහකි.

1) (I) වෛශ්‍ය ස්වධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 02)
(ii) බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණ තුනක් ගෙනහැර දක්වන්න. (ලකුණු 03)
(iii) සමූහාණ්ඩු පාලන ක්‍රමයේ අනන්‍යතා ලක්ෂණ හතරක් සැකෙවින් දක්වන්න. (ලකුණු 04)
(iv) ආධ්‍යාත්මික වශයෙන් කාන්තාව ලැබූ නිදහස සාධක මගින් තහවුරු කරන්න. (ලකුණු 05)
(v) නිගණ්ඨනාථපුත්තතුමන් සමාජ ගත කළ කර්මය සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06)

2) (i) බුදුරජාණන් වහන්සේගේ සත්ථා දේවමනුස්සානං ගුණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)
(ii) මහා කරුණාව බුද්ධ චරිතයෙන් පිළිබිඹු අවස්ථා තුනක් ගෙනහැර දක්වන්න. (ලකුණු 03)
(iii) තාදී ගුණය යන්න කෙටියෙන් දක්වා එය බුද්ධ චරිතයෙන් පිළිබිඹු වූ අවස්ථා හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)
(iv) අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ඇගයීමට ලක්කරන්න. (ලකුණු 05)
(v) බුද්ධ කාලීන පාලකයන් හා බුදු රදුන් අතර පැවැති සබඳතාව උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

3) (i) "මධුවා මඤ්ඤති බාලෝ"යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
(ii) ඉහත 3 (i) හී සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03)
(iii) සිඟාලෝවාද සූත්‍රයට අනුව සේවා සේවක යුතුකම් දහය නම් කරන්න. (ලකුණු 04)
(IV) පුද්ගල ජීවිතය පිරිහීමට බලපාන කරුණු මොනවාදැයි පරාභව සූත්‍රය ඇසුරෙන් පහදන්න. (ලකුණු 05)
(v) බුද්ධ කාලීන ධර්මදූත සේවය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගෙන් ඉටු වූ මෙහෙය අගය කරන්න. (ලකුණු 06)

II කොටස

4) (i) රාජ්‍ය පාලනයක් සඳහා 'බෞද්ධ දේශපාලන මූලධර්මවල' ඇති වටිනාකම පහදන්න. (ලකුණු 10)

(ii) පරිසර සංරක්ෂණයට අදාල බෞද්ධ ඉගැන්වීම් වල කාලීන වැදගත්කම ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10)

5) (i) දෙවන ධර්ම සංගායනාවේ පසුබිම කෙටියෙන් දක්වා ඒම සංගායනාව ශාසන විරස්තිථිය පිණිස හේතු වූ ආකාරය එහි ප්‍රතිඵල ඇසුරින් විමසීමට ලක් කරන්න. (ලකුණු 10)

(ii) වලහි විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය හා පරිපාලන ව්‍යුහය විස්තර කරන්න. (ලකුණු 10)

6) (i) ජපානයට බුදු දහම ලැබුණු ආකාරය කෙටියෙන් දක්වා එරට සංස්කෘතිය බුදු දහමෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) කනිෂ්ක රජුගේ ශාසනික සේවාවන් විමර්ශනය කරන්න. (ලකුණු 10)

7) (i) අභයගිරිය විහාරයෙන් සිදුවූ ආගමික සමාජීය සේවාව විස්තර කරන්න. (ලකුණු 10)

(ii) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ හඳුන්වා එහි ආසන හා මුද්‍රා පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

8) (i) 'සඳකඩ පහණ විශිෂ්ට නිර්මාණයකි.' මෙම මතය සනාථ කරන්න. (ලකුණු 10)

(ii) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට විවරණ සපයන්න.

(a) ආපද් ධර්ම
(b) සතර බ්‍රහ්ම විහරණ
(c) චතුර්විධ සැප
(d) චේතියර (ලකුණු 5×2=10යි)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank